සැ. යු.-- 2009.10.02 දින පළ වූ අංක 1,622 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවීය.
මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2008 වර්ෂයේ හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින්ගේ නාමාවලි පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,623 - 2009 ඔක්තෝබර් මස 09 වැනි සිකුරාදා - 2009.10.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1512 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1513 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 ඔක්තෝබර් මස 16 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 ඔක්තෝබර් මස 2 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරින් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්විමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත භටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැදී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරිම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුට ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාව යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — රත්නපුරය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ :

02. ඉල්ලුම්කරුවන් අදාල උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සෑහෙන දේපලක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථාන වල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2009 නොවැම්බර් මස 09 වන දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 සැප්තැම්බර් මස 19 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/A3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| රත්නපුර | ඉඹුල්පේ | රත්නපුර දිස්ත්‍රික්කයේ මොරහැල කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා කඩවත සහ මැද කෝරළය කෝට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුරය |
| රත්නපුර | ඉඹුල්පේ | රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඹුල්පේ කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා කඩවත සහ මැද කෝරළය කෝට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුරය |

10-254

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය

### පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී පුහුණුව සඳහා සිසුන් බඳවා ගැනීම - 2009

2009 අගෝස්තු මස 12 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය පරිදි ඉහත පාඨමාලාව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම පිණිස, සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකාවේ පුරවැසි අවිවාහක ස්ත්‍රී පක්ෂයෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. දිවයිනේ දිස්ත්‍රික්ක තුළ පවතින පුරප්පාඩු අනුව අදාල බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

02. පුහුණු පාඨමාලාවට බඳවා ගත හැකි සංඛ්‍යාව අනුව දිස්ත්‍රික්ක ජනගහන අනුපාතය පදනම් කර ගනිමින් සිසුන් පාඨමාලාවන් සඳහා තෝරාගනු ලැබේ.

03. පුහුණු පාඨමාලාව පූර්ණකාලීන පාඨමාලාවක් බැවින්, වෙනත් පාඨමාලා හදාරන සිසුන් මෙම පාඨමාලාව සඳහා අයදුම් නොකළ යුතුය.

04. *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) පාඨමාලාව සඳහා අවශ්‍ය වන සුදුසුකම් පහත සඳහන් වේ :-

| සංකේත අංකය | පුහුණු පාඨමාලාව | අ. පො. ස. (උ. පෙළ) සුදුසුකම් | අ. පො. ස. (සා. පෙළ) සුදුසුකම් | වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | උතුරු නැගෙනහිර පළාත් හැර දිවයිනේ සෙසු පළාත් හා කොළඹ මහ නගර සභාවේ පුරප්පාඩු පිරවීම සඳහා | අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් කවර හෝ විෂය ධාරාවකින් විෂයයන් තුනක් සහිතව එකවර සමත්වීම (මෙහිදී විද්‍යා විෂය ධාරාවන් සඳහා ප්‍රමුඛතාව දෙනු ලැබේ.) | අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව විෂයයන් 06කින් සමත්වීම | 2002 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා අ. පො. ස. (උ. පෙ.) විභාගයේ දී ලබා ගන්නා Z අගය මත ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කර ගනිමින් සුදුස්සන් තෝරාගනු ලැබේ. |
| 02 | නැගෙනහිර පළාතේ පමණක් සේවයේ යෙදවීම සඳහා | අ. පො. ස. (උ. පෙළ) විභාගයේ සුදුසුකම් සලකා බලනු නොලැබේ | අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව විෂයයන් 06කින් සමත්වීම | |
| 03 | දිවයිනේ වතු රෝහල්වල සේවය කිරීම සඳහා | අ. පො. ස. (උ. පෙළ) විභාගයේ සුදුසුකම් සලකා බලනු නොලැබේ. | අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව විෂයයන් 06කින් සමත්වීම | දෙමළ භාෂාව කථා කිරීමට හැකියාව තිබිය යුතුය |

05. *අනෙකුත් සුදුසුකම් :*

(අ) 2009.11.16 දිනට වයස අවුරුදු 18ට නොඅඩු, වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුවේ.

(ආ) මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

(ඇ) උස අඩි 04යි, අඟල් 10 (සෙන්ටි මීටර් 148)ට වැඩිවිය යුතුය.

(ඈ) අවිවාහක විය යුතුවේ. පුහුණු කාලසීමාව තුළ විවාහයට ඇතුලත් නොවිය යුතුවේ. න්‍යායික පුහුණුව ලබා දී තාවකාලිකව සේවයේ යොදවන සිසුවියන් ද විධිමත් පුහුණුව සඳහා අනුයුක්ත කර පත්වීම් ලබාදෙන තෙක් විවාහයට ඇතුලත් නොවිය යුතුය.

(ඉ) (i) *ඉහත 04 (අ) හි සංකේත අංක 01 යටතේ අයදුම් කිරීම.*—උතුරු නැගෙනහිර පළාත් හැර දිවයිනේ සෙසු පළාත් සඳහා අයදුම් කරන්නන් පදිංචි දිස්ත්‍රික්කය තුළ වසර තුනක පදිංචිය සනාථ කළ යුතුය.

(ii) *ඉහත 04 (අ) හි සංකේත අංක 02 යටතේ අයදුම් කිරීම.*—නැගෙනහිර පළාත සඳහා අයදුම් කරන්නන් සම්පූර්ණ සේවා කාලය තුළම නැගෙනහිර පළාතේ පමණක් සේවය කිරීමට බැඳී සිටිය යුතු අතර, පදිංචි දිස්ත්‍රික්කය තුළ වසර තුනක පදිංචිය සනාථ කළ යුතුය.

(iii) *ඉහත 04(අ) හි සංකේත අංක 03 යටතේ අයදුම් කිරීම.*—දෙමළ භාෂාව කථා කිරීමට හැකිවිය යුතු අතර, පදිංචි දිස්ත්‍රික්කය තුළ වසර තුනක පදිංචිය සනාථ කළ යුතුය. සම්පූර්ණ සේවා කාලය තුලම වතු ක්ෂේත්‍රයේ අඛණ්ඩව සේවය කරනු ලබන බවට ගිවිසුමක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග අත්සන් කළ යුතුය.

වතු පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී පුරප්පාඩු පවතින දිස්ත්‍රික්ක වනුයේ,

නුවරඑළිය/මහනුවර/මාතලේ/මොණරාගල/රත්නපුරය/කෑගල්ල/කොළඹ/ගාල්ල/මාතර/කුරුණෑගල

06. *අයදුම් කළ යුතු ක්‍රමය* :

(අ) ඉහත 04 (අ) හි සංකේත අංක 01, 02, 03 සඳහා වෙන වෙනම අයදුම්පත්වල ආකෘති දක්වා ඇති අතර, අයදුම්කරන්නන් තමා තෝරා ගන්නා ක්ෂේත්‍රය අනුව අදාල අයදුම්පත් පුරවා එවිය යුතු අතර, ක්ෂේත්‍රයන් තුනටම (03) අයදුම්කරන්නේ නම්, ඒ සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

* *සැලකිය යුතුයි.*-ඉහත 04 (අ) හි සංකේත අංක 01 යටතේ අයදුම් කරන්නන් පැහැදිලිව තමා අයදුම් කරන්නේ උතුරු නැගෙනහිර හැර දිවයිනේ සෙසු පළාත් සඳහා ද නැතහොත්, කොළඹ මහ නගර සභාව සඳහා ද යන්න අයදුම්පතෙහි ඉහල අදාල ස්ථානයේ පැහැදිලිව සටහන් කළ යුතුය.

(ආ) මේ සමඟ ඇති ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පතක් "ඒ 4" ප්‍රමාණයේ කඩදාසි භාවිත කර සකස් කර ගතයුතු වේ. අයදුම්පතේ “මුද්දරය” යන ස්ථානයේ රුපියල් 500 ක මුද්දරයක් අලවා තම අත්සන යොදා එය අවලංගු කළ යුතුවේ.

(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/අධ්‍යාපන පරිපාලන සේවයේ/රජයේ ගණකාධිකාරී සේවයේ නිලධාරියකු/රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 2,40,360 කට නොඅඩු වැටුපක් ලබන රජයේ නිලධාරියකු විසින් අපේක්ෂිකාවගේ අත්සන සහතික කළ යුතුවේ.

(ඉ) අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර එය බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ “පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුර සඳහා බඳවා ගැනීම - 2009” යනුවෙන් සඳහන් කොට 2009.11.16 දින හෝ ඊට පෙර ලැබෙනසේ “අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය ‘සුවසිරිපාය’, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10” යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

07. අයදුම්පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ.

08. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

09. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකුල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. ඉහත අධ්‍යාපන සහ අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂිකාවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී අවශ්‍ය සහතික මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කරන අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය ප්‍රතික්ෂේප කරනු ලැබේ. :-

(අ) උප්පැන්න සහතිකය;

(ආ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතික හෝ සහතික නිකුත්කර නැතිවිට බාහිර අයදුම්කරුවන්ට නිකුත් කළ ප්‍රතිඵල ලේඛනයේ හෝ අයදුම්කරු විභාගයට පෙනීසිටි විදුහලේ විදුහල්පතිවරයා විසින් නිකුත් කළ මුල් ලිපිය යනාදි ලිපි ලේඛන;

(ඇ) විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අ. පො. ස. (උ. පෙළ) Z අගය සඳහන් සහතිකය;

(ඈ) ජාතික හැඳුනුම්පත/ගමන් බලපත්‍රය හෝ රියැදුරු බලපත්‍රය;

(ඉ) දිස්ත්‍රික්කය තුල අවුරුදු 03කට පදිංචිය සනාථ කිරීම සඳහා 2005 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා ඡන්දදායක ලැයිස්තුවේ සහතික කළ පිටපත් ග්‍රාම නිලධාරී වෙතින් ලබාගෙන එය ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කොට ඉදිරිපත් කළ යුතුවේ. එහිදී අයදුම්කරුගේ නම ඡන්දදායක ලැයිස්තුවේ සඳහන්ව නොමැති නම්, ඔවුන්ගේ දෙමවුපියන්ගේ නම් ඡන්දදායක ලැයිස්තුවේ සඳහන්ව තිබිය යුතුය. එසේ නොමැති නම්, අදාල කාලය තුළ එම ප්‍රදේශයේ පදිංචි වී සිටි බවට ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාමසේවා නිලධාරියාගෙන් ලබාගත් පදිංචිය පිළිබඳව සහතිකය ඉදිරිපත් කළ යුතුය.

11. පුහුණු කිරීමේ පටිපාටිය :—

(i) තෝරාගත් අයදුම්කරුවන් ඒ ඒ පුහුණු පාසල්වලට ඇතුළත් කරනු ලැබේ. පුහුණු කාලය වසර 1 1/2කි. (මාස 06ක ක්ෂේත්‍ර පුහුණුවකි.)

(ii) පුහුණුව සඳහා ඇතුළත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසැල්වල බලපැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

(iii) පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායක වන හෝ තමන් ඇතුළත් කරගනු ලබන පුහුණු පාසලෙහි විභාග හා නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව නතර කිරීමට හැකිය.

(iv) පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ අභ්‍යාසලාභීන්ට රුපියල් 6,000 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

(v) පුහුණු පාසලට ඇතුලත්වන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසුව, පත්වීම් ලැබුණහොත් අවම වශයෙන් අවුරුදු 10ක කාලපරිච්ඡේදයක් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමඟ ගිවිසුමකට එළඹිය යුතුය. පුහුණුව ලබන කාලය තුළ පුහුණුවෙන් ඉවත් වුවහොත් හෝ පුහුණුව හැරගියහොත් ඉහත III ඡේදය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් පුහුණු කාලය තුළ ඇයට ගෙවන ලද දීමනාව හා රජය විසින් දරන ලද සියළුම වියහියදම් සඳහා වැය වූ මුදල ඇය විසින් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුවේ. එසේ නොවුවහොත් ගිවිසුම් ප්‍රකාරව එම මුදල් අයකර ගැනීමට නීතිමය පියවර ගනු ඇත.

12. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන්* :-පුහුණුව අවසානයේ දී අවසන් පරීක්ෂණයෙන් සමත්වන අපේක්ෂිකාවන්ට දෙපාර්තමේන්තුව මඟින් ඔවුන් ලබා ඇති කුසලතාවය පදනම් කර ගනිමින් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි III පන්තියේ තනතුරු සඳහා පත් කරනු ලැබේ.

13. *අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර.*-ඉල්ලුම්පත්‍ර පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව තොරතුරු ඇතුලත් කළ යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු ඉහත කී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, ඒ දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/සේවයෙන් පහකරන අතර, නැවත රජයේ සේවයට නොගන්නාවුන්ගේ අසාධු ලේඛනයට ඇයගේ නම ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

14. තෝරාගත් අයදුම්කරුවන් අදාල පාඨමාලාවන් හැදෑරීමට සහ ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික සහ මානසික වශයෙන් යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු වස් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අපේක්ෂකයින් පුහුණු පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

15. ඉහත පරිදි බඳවා ගනු ලබන සියළුම නිලධාරීන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් හා වෙනත් රෙගුලාසිවලටද, රජය විසින් වරින්වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ටද යටත්වනු ඇත.

16. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මඟින් ආවරණය නොවන යම් ගැටළු සහගත කරුණක් උද්ගත වුවහොත්, ඒ පිළබඳ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

වෛද්‍ය එච්. ඒ. පී. කහඳලියනගේ,
ලේකම්,
සෞඛ්‍ය, ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය.

2009 සැප්තැම්බර් මස 18 වැනි දින,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

**ආදර්ශ අයදුම්පත්‍රය - 04 (අ) හි සංකේත අංක 01**

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ උතුරු නැගෙනහිර පළාත් හැර දිවයිනේ සෙසු පළාත්/කොළඹ මහ නගර සභාව සඳහා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් පුහුණුව සඳහා බඳවා ගැනීම - 2009

* ඔබ අයදුම්කරන ක්ෂේත්‍රය ඉදිරියේ ✓ ලකුණ සටහන් කරන්න.

❑ උතුරු නැගෙනහිර හැර දිවයිනේ සෙසු පළාත් සඳහා

❑ කොළඹ මහ නගර සභාව සඳහා

01. (අ) මුලකුරු සමඟ අගට යෙදෙන නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

03. තැපැල් ලිපිනය : සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

............................. .............................
............................. .............................
............................. .............................
............................. .............................

04. (අ) ස්ථිර ලිපිනය : සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

............................. .............................
............................. .............................
............................. .............................
............................. .............................

(ආ) දිස්ත්‍රික්කය :————.
(ඇ) ඔබ මෙම දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවෙක් ද? ඔව්/නැත :————.
(ඉ) ඔව් නම් කොපමණ කලක පටන් ද? :————.

05. උපන් දිනය වර්ෂය :————. මාසය :————. දිනය :————.
2009.11.16 දිනට වයස අවුරුදු :————. මාස :————. දින :————.

06. උස :
අඩි :————. අඟල් :————.

07. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

(අදාල කොටුවේ ✓ ලකුණ යොදන්න)

08. විවාහක/අවිවාහක බව :————.

09. අධ්‍යාපන සුදුසුකම් :—

(අ) අ. පො. ස. (උ. පෙළ) විභාගය (ලකුණු සටහන් පිටපත් අමුණන්න.) විද්‍යා විෂය ධාරාවන් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.)
විභාගයට ඉදිරිපත් වූ දිස්ත්‍රික්කය :————.
විභාගයේ වර්ෂය :————.
විභාග අංකය :————.
Z අගය :————.

| විෂය | ශ්‍රේණිය |
|---|---|
| 01. | |
| 02. | |
| 03. | |
| 04. | |

(ආ) අ. පො. ස. (සා. පෙළ) විභාගය - පළමු වර
විභාගයේ වර්ෂය :———.
විභාග අංකය :———.

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

අ. පො. ස. (සා. පෙළ) විභාගය - දෙවැනි වර
විභාගයේ වර්ෂය :———.
විභාග අංකය :———.

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

10. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කර තිබේද?

ඔව් ☐ නැත ☐

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

ඔව් නම් විස්තර සපයන්න. :———.

11. අයැදුම්කරුගේ සහතිකය

(අ) මම වෙනත් කිසිදු පූර්ණකාලීන පාඨමාලාවකට සහභාගී නොවන බවටත්, මෙම අයැදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවටත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දැන සිටිමි.

මුද්දර
කොටුව

———
අයැදුම්කරුගේ අත්සන.

දිනය :———.

12. අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයැදුම්පත ඉදිරිපත් කරනු ලබන …………………… මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඇය මා ඉදිරිපිටදී 2009 ………… දින ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

———
සහතික කරන්නාගේ අත්සන.

දිනය :———.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :———.

තනතුර :———.
ලිපිනය :———.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

ආදර්ශ අයදුම්පත්‍රය - 04 (අ) හි සංකේත අංක 02

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ නැගෙනහිර පළාත සඳහා
පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් පුහුණුව සඳහා බඳවා ගැනීම - 2009

01. (අ) මුලකුරු සමඟ අගට යෙදෙන නම :———.
(ඉංග්‍රිසි කැපිටල් අකුරෙන්)

(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.

(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :———.

02. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

03. තැපැල් ලිපිනය : සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රිසියෙන්

.............................. ..............................
.............................. ..............................
.............................. ..............................
.............................. ..............................

04. (අ) ස්ථිර ලිපිනය : සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

.............................. ..............................
.............................. ..............................
.............................. ..............................
.............................. ..............................

(ආ) දිස්ත්‍රික්කය :———.
(ඇ) ඔබ මෙම දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවෙක් ද? ඔව්/නැත :———.
(ඉ) ඔව් නම් කොපමණ කලක පටන් ද? :———.

05. උපන් දිනය :- වර්ෂය :———. මාසය :———. දිනය :———.
2009.11.16 දිනට වයස, අවුරුදු :———, මාස :———, දින :———,

06. උස :
අඩි :———. අඟල් :———.

07. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද යන වග :

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

08. විවාහක/අවිවාහක බව :———.

09. අධ්‍යාපන සුදුසුකම් :

අ. පො. ස. (සා. පෙළ) විභාගය - පළමු වර
විභාගයේ වර්ෂය :———.
විභාග අංකය :———.

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

අ. පො. ස. (සා. පෙළ) විභාගය - දෙවන වර
විභාගයේ වර්ෂය :———.
විභාග අංකය :———.

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

10. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කර තිබේ ද?

ඔව් ☐ නැත ☐

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

ඔව් නම් විස්තර සපයන්න :———.

11. අයැදුම්කරුගේ සහතිකය :

(අ) මම වෙනත් කිසිදු පූර්ණකාලීන පාඨමාලාවකට සහභාගී නොවන බවටත්, මෙම අයැදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවටත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) ගැසට් නිවේදනයේ 05 වගන්තියේ (ඉ) (II) අනුව නැගෙනහිර පළාත තුළ සේවය කිරීම සඳහා මා තෝරාගන්නේ නම්, සම්පූර්ණ සේවා කාලය තුළ නැගෙනහිර පළාත් සභාබල ප්‍රදේශය තුලම අඛණ්ඩව සේවය කරන බවට පොරොන්දු වෙමි.

(ඇ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දැන සිටිමි.

මුද්දර
කොටුව

———
අයැදුම්කරුගේ අත්සන.

දිනය :———.

12. අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයැදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................. මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඇය මා ඉදිරිපිට දී 2009 ........................ දින ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

―――.
සහතික කරන්නාගේ අත්සන

දිනය :―――.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :―――.

තනතුර :―――.

ලිපිනය :―――.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

ආදර්ශ අයැදුම්පත්‍රය - 04 (අ) හි සංකේත අංක 03

සෞඛ්‍ය ආරක්‍ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ වතු රෝහල් සඳහා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් පුහුණුව සඳහා බඳවා ගැනීම - 2009

01. (අ) මුලකුරු සමඟ අගට යෙදෙන නම :―――.
(ඉංග්‍රිසි කැපිටල් අකුරෙන්)

(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :―――.

(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :―――.

02. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | |

03. තැපැල් ලිපිනය : සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රිසියෙන්

| සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රිසියෙන් |
|---|---|
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |

04. (අ) ස්ථිර ලිපිනය : සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

| සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |

(ආ) දිස්ත්‍රික්කය :―――.
(ඇ) ඔබ මෙම දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවෙක් ද? ඔව්/නැත :―――.
(ඉ) ඔව් නම් කොපමණ කලක පටන් ද? :―――.

05. උපන් දිනය : වර්ෂය :―――. මාසය :―――. දිනය :―――.
2009.11.16 දිනට වයස අවුරුදු :―――. මාස :―――. දින :―――.

06. උස :

අඩි :―――. අඟල් :―――.

07. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

08. විවාහක/අවිවාහක බව :———.

09. අධ්‍යාපන සුදුසුකම් :

අ. පො. ස. (සා. පෙළ) විභාගය - පළමු වර
විභාගයේ වර්ෂය :———.
විභාග අංකය :———.

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

අ. පො. ස. (සා. පෙළ) විභාගය - දෙවන වර
විභාගයේ වර්ෂය :———.
විභාග අංකය :———.

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

10. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කර තිබේ ද ?

ඔව් ☐ නැත ☐

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

ඔව් නම් විස්තර සපයන්න. :———.

11. අයදුම්කරුගේ සහතිකය :

(අ) මම වෙනත් කිසිදු පූර්ණකාලීන පාඨමාලාවකට සහභාගී නොවන බවටත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවටත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) ගැසට් නිවේදනයේ 05 වගන්තියේ (ඉ) (III) අනුව දිවයිනේ වතු රෝහල්වල සේවය කිරීමට මා තෝරාගන්නේ නම්, සම්පූර්ණ සේවා කාලය තුළ වතු රෝහල්වල අඛණ්ඩව සේවය කරන බවට පොරොන්දු වෙමි.

(ඇ) ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දැන සිටිමි.

මුද්දර කොටුව

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

12. අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයැදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඇය මා ඉදිරිපිට දී 2009 ........................ දින ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

———,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :———.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :———.

තනතුර :———.

ලිපිනය :———.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න).

10-265

---

## සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ බඳවාගත් සංවර්ධන නිලධාරීන් හා ව්‍යාපෘති නිලධාරීන් සඳහා වන දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2009

සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ බඳවාගත් සංවර්ධන නිලධාරීන් සඳහා දොළොස් වන වැටුප් පියවරට එළඹීමට පෙර හා ව්‍යාපෘති නිලධාරීන් සඳහා හත්වැනි වැටුප් පියවරට එළඹීමට පෙර සමත්විය යුතු කාර්යක්ෂමතා කඩඉම් විභාග, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2010 ජනවාරි මස කොළඹ දී පවත්වනු ලැබේ. මෙම විභාග සඳහා අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය 2009 නොවැම්බර් 09 වැනි දින බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. *විභාග පරිපාටිය.*—මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත. :

(i) විෂයය අංකය - 1 - ආර්ථික සංවර්ධනය/ක්‍රම සම්පාදනය (කාලය පැය 03 යි) ලකුණු 100 යි;

(ii) විෂයය අංක 2- සමාජ විද්‍යාව/ප්‍රාදේශීය සංවර්ධනය (කාලය පැය 02 යි) ලකුණු 100 යි;

සටහන ා

(අ) ඉහත විෂයයන් දෙක සඳහා එකම වාරයකදී හෝ වෙන් වෙන් වශයෙන් වාර කිහිපයක දී හෝ පෙනී සිටීමට නිලධාරියෙකුට අවසර ඇත.

(ආ) සාමාර්ථ්‍යය සඳහා සෑම ප්‍රශ්න පත්‍රයකින් ම ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලබාගත යුතුය.

(ඇ) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. ඔබ ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් ඔහු විසින් පනවන ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

03. විෂයයන් ඃ-

(අ) විෂයය අංක -1 ආර්ථික සංවර්ධනය/ක්‍රම සම්පාදනය (කාලය පැය 03 යි) - ලකුණු 100 යි :

(i) ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය, ප්‍රතිපත්ති හා ගැටලු;
(ii) ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඇගයීම;
(iii) දත්ත එක්රැස් කිරීම, ගොනු කිරීම හා විශ්ලේෂණය පිළිබඳ සාමාන්‍ය දැනුම.

(ආ) විෂය අංක -2 සමාජ විද්‍යාව/ප්‍රාදේශීය සංවර්ධනය (කාලය පැය 02 යි) ලකුණු 100 යි :

(i) ග්‍රාමීය සමාජ විද්‍යාව,
(ii) ශ්‍රී ලංකාවේ ගැමි සමාජය,
(iii) ශ්‍රී ලංකාවේ නාගරීකරණය,
(iv) ප්‍රාදේශීය සංවර්ධනය.

04. *සුදුසුකම්.*—සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ බඳවාගත් සියලු සංවර්ධන නිලධාරි හා ව්‍යාපෘති නිලධාරි තනතුරු දරන නිලධාරීන් මේ සඳහා සුදුසුකම් ලබයි.

05. *අයැදුම් කළයුතු පිළිවෙල ඃ*

(අ) මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් ඉල්ලුම්පත්‍රය සකස් කර ගත යුතුය. 01 සිට 06 තෙක් ශීර්ෂ 1 වැනි පිටුවේ ද සෙසු ශීර්ෂ දෙවැනි පිටුවේ ද පිළියෙල කරගත යුතුය. එය සම්පූර්ණ කළ යුත්තේ අපේක්ෂකයා විසින් සිය අත් අකුරිනි. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බව හා සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ

සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව ඉදිරිපත් කළ යුතු අතර එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. (මෙම අයැදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.).

(ආ) අයැදුම්පත්‍ර තමා සේවය කරන කාර්යාලයේ ප්‍රධානියා මගින් 2009 නොවැම්බර් මස 09 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ බත්තරමුල්ල, පැලවත්ත, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ, විභාග කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ඇ) අයැදුම්පත්‍ර සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් ය. ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ.

(ඈ) අදාළ ආකෘතියට අනුකූල නොවන, අසම්පූර්ණ, එමෙන්ම ප්‍රමාද වී ලැබෙන අයැදුම්පත්‍ර කිසිම දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. ඉල්ලුම්පත්‍ර තැපෑලේදී නැතිවීම නිසා හා ප්‍රමාද වීම පිළිබඳව කෙරෙන පැමිණිලි සලකා බලනු නොලැබේ.

06. අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබා ගත් අයැදුම් පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, ඔහු විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් කෙරේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. තවද විභාගය ආරම්භ වන දිනයේ දී තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

07. *අනන්‍යතාව.*—අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතුරින් කුමක් වුවත් භාර ගැනේ. :

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්).

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයැදුම්කරුවෙකුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීම හෝ නොපිළිගැනීමට හෝ විභාග කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

08. *විභාග ගාස්තු :* මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන්ගෙන් පහත පදනම මත ගාස්තු අය කෙරේ. :

| | | |
|---|---|---|
| (අ) | පළමු වතාව සඳහා | ගාස්තු අය නොකෙරේ |
| (ආ) | පළමු වතාවෙන් පසු සම්පූර්ණ විභාගය සඳහා | රු. 200.00 යි |
| (ඇ) | එක් විෂයයක් සඳහා | රු. 100.00 යි |

* විභාග කොමසාරිස් ජනරාල්ගේ 2003-.20-13 ආදායම් ශීර්ෂයට බැර වන සේ දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගත් මුදල් කුවිතාන්සියක් නොගැලවෙන සේ අයදුම්පතේ අලවා එවිය යුතුය. (මෙම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.).

09. මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත්කර ඇති තමන්ගේ ආයතනවල නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා ආයතන ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දෙන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

10. මෙම රෙගුලාසිවලට අඩංගු නොවූ යම් කරුණක් වෙතොත් මෙම අමාත්‍යාංශයේ අභිමතය පරිදි ඒ ගැන ක්‍රියාකරනු ලැබේ.

ධාරා විජයතිලක,
සැලසුම් ක්‍රියාත්මක කිරීමේ
අමාත්‍යාංශයේ ලේකම්.

සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය,
කොළඹ 01.

ආදර්ශ අයැදුම් පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

## සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ බඳවාගත් සංවර්ධන නිලධාරීන් සහ ව්‍යාපෘති නිලධාරීන් සඳහා වන දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2009

## Second Efficiency Bar Examination For Development Officers and Project Officers Recruited under the Ministry of Plan Implementation - 2009

*සැලකිය යුතුයි :-* මෙම ආකෘති පත්‍රය නිවැරදිව හා පැහැදිලිව අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුයි.

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල -2
දෙමළ -3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. (i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*උදා :* SILVA, B. A.)

(ii) අගට යෙදෙන නම මුලකුර සමග (සිංහලෙන්/දෙමළෙන්) :——————.

(iii) මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්/දෙමළෙන්) :——————.

(iv) මුලකුරුවලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :——————.

02. (i) කාර්යාලයීය ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :———.
(ii) කාර්යාලයීය ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ඇත.) :———.

03. උපන් දිනය ඃ අවුරුද්ද ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

04. සංවර්ධන නිලධාරි/ව්‍යාපෘති නිලධාරි තනතුරෙහි වැඩ භාරගත් දිනය (නිත්‍ය වශයෙන් ම රාජකාරි භාරගත් දිනය සඳහන් කළ යුතුයි)

අවුරුද්ද ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

05. *ගැසට් නිවේදනයේ 2 වන ඡේදය යටතේ ඉදිරිපත් වන විෂයයන් ඃ*

| *විෂයය* | *විෂය අංකය* |
|---|---|
| ———. | ☐ |
| ———. | ☐ |

06. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :———.

07. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තු :———.

විභාග කොමසාරිස් ජනරාල්ගේ 2003-20-13 ආදායම් ශීර්ෂයට බැරවනසේ දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගත් මුදල් කුවිතාන්සියක් නොගැලවෙන සේ මෙම කොටුවේ ඇලවිය යුතුයි. (මෙම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.)

08. මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් විස්තර නිවැරදි බව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති පිළිපැදීමට ද මම පොරොන්දු වෙමි. ඉදිරිපත් වී ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බව ප්‍රකාශ කරමි.

———,
අපේක්ෂකයාගේ/
අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :———.

*සටහන.*—තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකුගේ හෝ තමාගේ ප්‍රාදේශීය ප්‍රධානියාගේ ඉදිරිපිට දී අයදුම්කරු අත්සන් කළ යුතුයි.

09. අත්සන සහතික කිරීම ඃ

මාගේ කාර්යාලයේ නිලධාරියෙකු/නිලධාරිනියක වූ, මා පෞද්ගලිකව හඳුනන..................මහතා/මහත්මිය/මෙනෙවිය 20 ............ වැනි දින මා ඉදිරිපිට දී අත්සන කළ බව මෙයින් සහතික කරමි.

———,
අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතුයි).

නම :———.
පදවි නාමය :———.
ලිපිනය :———.

10. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ඃ

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්,

(ii) අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතුයි)

නම :———.
පදවි නාමය :———.
දිනය :———.

10-268

---

**පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියේ පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීම - 2009**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියේ පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *විභාගයඃ*-2009 නොවැම්බර් මාසයේ දී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් මහනුවර දී මෙම විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

03. *සේවා කොන්දේසි.*—රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, මෙහි පහත සඳහන් කොන්දේසිවලට ද, යටත්ව පර්යේෂණ සහකාර සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියට බඳවා ගනු ලැබේ :—

(i) පත්කරනු ලබන නිලධාරියා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත්වේ;

(ii) විවෘත බඳවා ගැනීම් යටතේ පත්කරනු ලබන නිලධාරීන් වසර 3 ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු පත් කරනු ලැබුවහොත්, එක් වසරක පරීක්ෂණ කාල සීමාවකට යටත් කරනු ලැබේ. විවෘත බඳවා ගැනීම් තුළින් පත් කරනු ලබන නිලධාරීන් තනතුරේ ස්ථිර කිරීමට පෙරාතුව, නියමිත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව තිබීම ද අවශ්‍ය වේ;

(iii) රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාවයක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබාගත යුතුය;

(iv) පත්වීම් ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලටද, ආයතන සංග්‍රහයේ විධි විධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලටත් යටත් වේ.

04. *වැටුප් පරිමාණය.*—MN—3—2006A පර්යේෂණ සහකාර සේවයේ II"ආ'' ශ්‍රේණියේ රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - 27,885.
(රා. පරි. ච. ලේ. 07/2008 අනුව මාසික)

මෙම වැටුප් පරිමාණයේ රු. 15,005 - 4 x 180 - 6 x 240 - 17,165 වැටුප් පියවරයන් මෙම ශ්‍රේණියට හිමිවේ.

II "ආ" ශ්‍රේණියේ නිලධාරින් තුන්වන වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

05. *වයස් සීමාව* :-

(i) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට උපරිම වයස් සීමාව බල නොපායි;
(ii) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය;
(iii) මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

06. *අධ්‍යාපන සුදුසුකම්.*—ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලයක ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම සහ රසායන විද්‍යාව, කෘෂිකර්ම විද්‍යාව හා ජීව විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා විෂයයන් 3 කින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය එකවරක සමත්වීම සහ භාෂාව හෝ සාහිත්‍ය සහ අංක ගණිතය/ගණිතය විෂයයන්ට සම්මාන සාමාර්ථය සහිතව විෂයන් 06 කින් අ. පො. ස. (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම; හෝ

ඒ හා සමාන විභාගයකින් සමත්වීම.

*සටහන.*—ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් ඩිප්ලෝමාවක් ලබා ගත් අය එම විශ්වවිද්‍යාලයේ එම ඩිප්ලෝමාවට අදාළ පදනම් පාඨමාලාව සමත් වී ඇත්නම් අ.පො.ස. (සා. පෙළ) සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කළ හැක.

07.*බඳවා ගැනීමේ ක්‍රමය.*—මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන පොදු තරග විභාගයට පෙනී සිටිය යුතුය.

(i) පොදු තරග විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්න පත්‍රයකටම 40% ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයින් කුසලතා අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීම සිදු නොකරන අතර, සුදුසුකම් තහවුරු කළ අයදුම්කරුවන් විභාගයේ දී ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

08. *විභාගය* :-

(i) මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.
(ii) අපේක්ෂකයින් කැමති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක.
(iii) ඉල්ලීම් කරන ලද භාෂා මාධ්‍ය විභාගයේ දී වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.
(iv) විභාග ගාස්තුව රු. 300.
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට නිකුත් කරන ලද පේරාදෙණිය, තැපැල් කාර්යාලයෙන් මුදල් කර ගත හැකි වනසේ ලබාගත් මුදල් ඇනවුමක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය.

(v) *විභාග විෂයයන්.*—විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ :

1. බුද්ධි පරීක්ෂණය
2. තාක්ෂණික ප්‍රශ්න පත්‍රය.

(vi) *විෂය නිර්දේශය* :-

(අ) *බුද්ධි පරීක්ෂණය* :- කාලය පැය 1 යි. මුළු ලකුණු 100 යි. අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයන්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයන්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

(ආ) *තාක්ෂණ ප්‍රශ්න පත්‍රය* :- කාලය පැය 1 යි. මුළු ලකුණු 100 යි පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්නපත්‍රයකි :

(i) රසායනාගාර උපකරණ හඳුනාගැනීම හා නඩත්තුව;

(ii) රෝග විනිශ්චය සඳහා යොදා ගන්නා පරීක්ෂණ ක්‍රම :
ව්‍යාධි වේද,
පරපෝෂිත වේද,
ක්ෂුද්‍ර ජීව වේද,
මස්තු වේද,
පෝෂණ.

(iii) තත්ත්ව පාලනය සඳහා යොදා ගන්නා පරීක්ෂණ ක්‍රම :
භෞතික පරීක්ෂණ,
රසායනික පරීක්ෂණ,
සංවේදතා පරීක්ෂණ.

(iv) රසායානාගාර පවිත්‍රතාව, විෂබීජහරණය.

(v) සාම්පල් ලබාගැනීම, ගබඩා කිරීම, ප්‍රවාහනය

09. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :-

(i) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනය සමග ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. 8 1/2 x 12 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කර ගත් ඉල්ලුම්පත්‍රය 2009.10.23 දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "පර්යේෂණ සහකාර" තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන.*—රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(i) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී ඉල්ලුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(ii) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. ඉල්ලුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍රය විභාගය පැවැත්වෙන දිනයට දින හතරකට කලින් නොලැබුණහොත් පහත සඳහන් විස්තර ඇතිව වහාම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට දැන්විය යුතුය.

(i) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :
(ii) ලිපිනය :
(iii) ඉල්ලුම්පත් තැපැල් කළ දිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය :

10. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය. :

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සුදුසුකම් තහවුරු කිරීමේ සහතික.

*අපේක්ෂකයාගේ අනන්‍යතාවය.*—විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාග ශාලාවේ දී තමාගේ අනන්‍යතාව විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඔප්පුකර සිටිය යුතුය. ඒ සඳහා පහත ලේඛන පිළිගැනේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රය,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය (විභාග දිනට අවුරුදු 3 කට කලින් නිකුත් කරන ලද).

*සාවද්‍ය තොරතුරු සැපයීම.*—මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හැකි වන්නේය. අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැන ඉදිරිපත් කළ බව පෙනී ගිය හොත් ඔහු සේවයෙන් පහ කිරීමට යටත් වන්නේය.

මෙම *ගැසට් පත්‍රයේ* I වැනි කොටස (II ''අ'') ඡේදයේ ආරම්භයේ ප්‍රකාශිත රාජ්‍ය සේවයට පත් කිරීමට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි හා විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් කෙරෙහි අවධානය යොමු කර ඒවා පිළිපැදිය යුතුය.

11. මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් ද විභාගය මගින් බඳවා ගත යුතු අපේක්ෂක සංඛ්‍යාව සම්බන්ධයෙන් ද තීරණයක් ගැනීමේ බලය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතුවේ. එය අවසන් තීරණය වේ.

එච්. එම්. එස්. පී. හේරත්,
සත්ත්ව නිෂ්පාදන හා
සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

2009 සැප්තැම්බර් මස 15 වැනි දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියේ පර්යේෂණ සහකාර නිලධාරි තනතුර සඳහා අයදුම්පත

| | |
|---|---|
| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය | |

(කාර්යාලීය ප්‍රායෝජනය සඳහා පමණි)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ කොටුව තුළ ලියන්න)

01. නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————. (උදා :) SILVA, B. A.

1.2 සම්පූර්ණ නම සිංහලෙන් :————.

1.3 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

02. ලිපිනය :

2.1 පෞද්ගලික :————.

2.2 රාජකාරි ලිපිනය :————.

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය :————.

03. ස්ත්‍රී පුරුෂ භාවය (අදාළ කොටුව තුළ ✓ සළකුණු කරන්න) :

3.1 ස්ත්‍රී ☐
පුරුෂ ☐

3.2 උපන් දිනය :

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස :

අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

3.4 විවාහක අවිවාහක බව (අදාළ ✓ සලකුණු කොටුව තුළ සළකුණු කරන්න) :

විවාහක ☐
අවිවාහක ☐

04. අධ්‍යාපන සුදුසුකම් :-

4.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය :

වර්ෂය :————. මාසය :————.

| *විෂයය* | *ලබාගත් සාමාර්ථය* | *විභාග අංකය* |
|---|---|---|
| | | |

4.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :

වර්ෂය :————. මාසය :————.

| *විෂයය* | *ලබාගත් සාමාර්ථය* | *විභාග අංකය* |
|---|---|---|
| | | |

4.3 (අ) සත්ව පාලන ඩිප්ලෝමාව ලබාගත් ආයතනය :———.

4.4 සත්ව පාලන ඩිප්ලෝමාව ලබාගත් වර්ෂය :————.

05. වර්තමාන රැකියාව හා කලින් දැරූ පත්වීම් : (ඇත්නම් පමණක්)

| තනතුර | ආයතනය | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

06. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලයේ නම :————.
මුදල් ඇණවුම් අංකය :————.

සම්පූර්ණ විභාග ගාස්තුව රු. 300 කි. දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට.
ගෙවන කාර්යාලය : පේරාදෙණිය
කුවිතාන්සිය මෙහි අලවන්න.

07. මෙම ඉල්ලුම්පත්‍රයේ ම විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා, මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගත හොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

* දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන්ට පමණක් අදාළ වේ.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

නිලධාරියා විසින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, අපේක්ෂකයා/අපේක්ෂිකාව ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියා,
(නිල මුද්‍රාව තැබිය යුතුය.)

පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

10-380

**පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියට බඳවා ගැනීම - 2009**

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *විභාගය* :- 2009 නොවැම්බර් මාසයේ දී සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් මහනුවර දී මෙම විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමට සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

03. *සේවා කොන්දේසි* :- රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද මෙහි පහත සඳහන් කොන්දේසිවලට ද යටත්ව පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

(i) පත්කරනු ලබන නිලධාරියා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් විය යුතු යි.

(ii) බඳවාගනු ලබන නිලධාරීන් වසර 03 ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු පත් කරනු ලැබුවහොත්, එක් වසරක පරීක්ෂණ කාල සීමාවකට යටත් කරනු ලැබේ. පත් කරනු ලබන නිලධාරීන් තනතුරේ ස්ථිර කිරීමට පෙරාතුව, නියමිත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව තිබීම ද අවශ්‍ය වේ.

(iii) ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සේවයට ඇතුළු වූ නිලධාරීන් තනතුර ස්ථිර කිරීමේ දී වෙනත් කරුණු වලට අමතරව පරිවාස කාලය තුළ රාජ්‍ය භාෂාවත් එනම්, සිංහල හෝ දෙමළ භාෂාවේ ප්‍රවීණතාවය ලබාගත යුතු ය. රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ වලින් නිදහස් කරවා ගැනීම සඳහා අ.පො.ස. (සා. පෙ.) විභාගයේ සිංහල/දෙමළ විෂයයන් සමත් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද විෂය ප්‍රතිඵල සටහනේ සහතික කළ පිටපතක් හෝ විභාග සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතු ය.

(iv) පත්වීම ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද, ආයතන සංග්‍රහයේ විධි විධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ නියෝගවලටත් යටත් වේ.

04. *වැටුප් පරිමාණය*.—MT-2-2006A- රු. 14,570 - 10 x 170 - 11 x 180 - 6 x 240 - 14 x 320 - රු. 24,170 (රා. ප. ච. 06/2006 (IV) අනුව මාසික) මෙම වැටුප් පරිමාණයේ රු. 14,570 - 10 x 170 - රු. 16,270 වැටුප් පියවරයන් මෙම තනතුරට අදාළ වේ.

05. *වයස් සීමාව* :-

(i) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

(ii) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

(iii) මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.

06. *අධ්‍යාපන සුදුසුකම්.*—2009.10.12 වැනි දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, කෘෂිකර්මය යන විෂයයන් දෙකක් සහිතව විෂයයන් 3 කින් සමත්වීම; සහ

වැලිසර, අනුරාධපුරය, කුණ්ඩසාලේ සත්ව පාලන විද්‍යාලවලින් ලබාගත් දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකය.

*සටහන.*—ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර පූර්ව සුදුසුකම් ලබාගෙන තිබිය යුතු ය. ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන ඉල්ලුම්පත් වලංගු නොවේ.

07. *බඳවා ගැනීමේ ක්‍රමය.*—මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන පොදු තරග විභාගයට පෙනී සිටිය යුතු ය.

(i) පොදු තරග විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්න පත්‍රයකට ම 50% ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයින් කුසලතා අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීම සිදුනොකරන අතර, සුදුසුකම් තහවුරු කළ අයදුම්කරුවන් විභාගයේ දී ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.

08. විභාගය :—

(i) මෙම විභාගය සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.
(ii) අපේක්ෂකයින් කැමති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක.
(iii) ඉල්ලීම කරන ලද භාෂා මාධ්‍යය විභාගයේ දී වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.
(iv) විභාග ගාස්තුව රු. 300 කි. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට නිකුත් කරන ලද පේරාදෙණිය, තැපැල් කාර්යාලයෙන් මුදල් කර ගත හැකි වනසේ ලබාගත් මුදල් ඇණවුමක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතු ය.
(v) විභාග විෂයයන් : විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.
  (i) බුද්ධි පරීක්ෂණය,
  (ii) තාක්ෂණ ප්‍රශ්න පත්‍රය.
(vi) විෂය නිර්දේශය :

(අ) බුද්ධි පරීක්ෂණය : කාලය පැය 01 යි. මුළු ලකුණු 100 යි. අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයන් ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයන් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත ය.

(ආ) තාක්ෂණ ප්‍රශ්න පත්‍රය :- කාලය පැය 01 යි. මුළු ලකුණු 100 යි. පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

(i) ශ්‍රී ලංකා කෘෂිකාර්මික හා සත්වපාලන කටයුතු පිළිබඳ පවත්නා සම්පත්, විභවයන් වර්තමාන තත්ත්වයන් හා ආර්ථිකයට ඇති දායකත්වය,
(ii) ශ්‍රී ලංකාවේ සත්ව නිෂ්පාදන රටා, නිෂ්පාදන ප්‍රමාණයන් හා අලෙවිකරන ක්‍රම, ශ්‍රී ලංකාවේ පවතින සත්වපාලන ගොවිපළ රටා ඒවායේ පිහිටීම හා විසිරීම,
(iii) ගොවිපළ සතුන් අභිජනනය සඳහා බහුලව යොදාගන්නා ක්‍රම,
(iv) බෝවන සත්ව රෝග, සත්වරෝග මර්ධන ක්‍රියා පිළිවෙත් රෝගී සතුන්ගේ නියැදි රැස්කිරීම හා ප්‍රවාහනය,
(v) ඒකාබද්ධ ගොවිපල් ක්‍රම හා ප්‍රතිචක්‍රීයකරන ක්‍රම,
(vi) සත්වපාලන හා ආශ්‍රිතව කර්මාන්ත, කිරි සැකසීම, මස් සැකසීම, සත්ව ආහාර නිෂ්පාදනය,
(vii) සත්ව නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ ආදායම් වියදම් ගණනය ක්‍රම, ගොවිපල් වාර්තාකරණය හා ගිණුම් විශ්ලේෂණය, සත්ව ගොවිපල් සැලසුම් කරණය,
(viii) විද්‍යාත්මක තොරතුරු ප්‍රචාරණ ක්‍රම භාවිතය හා ඒවායේ ඵලදායීතාවයන්.

(09) *ඉල්ලුම් කිරීමේ ක්‍රමය :*

(i) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනය සමග ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. අඟල් 8 1/2 x 12 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත ම ප්‍රයෝජනයට ගනිමින් සකස් කරගත් ඉල්ලුම්පත්‍රය 2009.10.23 දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "පශු සම්පත් සංවර්ධන නිලධාරී" තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය යනුවෙන් පැහැදිලිව සටහන් කල යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන.*—රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(ii) සෑම ආකාරයකින් ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ඉල්ලුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.
(iii) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. ඉල්ලුම්කරුවන්ට විභාග ප්‍රවේශපත්‍රය විභාගය පැවැත්වෙන දිනයට දින හතරකට කලින් නොලැබුණහොත් පහත සඳහන් විස්තර ඇතිව වහාම සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට දැන්විය යුතු ය.

i. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.
ii. ලිපිනය :————.
iii. ඉල්ලුම්පත් තැපැල් කළ දිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය :————.

10. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය.

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සුදුසුකම් තහවුරු කිරීමේ සහතික.

අපේක්ෂකයාගේ අනන්‍යතාවය :-

විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක් ම විභාග ශාලාවේ දී තමාගේ අනන්‍යතාවය විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඔප්පුකර සිටිය යුතු ය. ඒ සඳහා පහත ලේඛන පිළිගැනේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත් පත්‍රය;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

*සාවද්‍ය තොරතුරු සැපයීම :-*

මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ, විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හැකි වන්නේ ය.

අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැන ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු සේවයෙන් පහ කිරීමට යටත් වන්නේ ය.

මෙම ගැසට් පත්‍රයේ 1 වැනි කොටස (II "අ") ඡේදයේ ආරම්භයේ ප්‍රකාශිත රාජ්‍ය සේවයට පත් කිරීමට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි හා විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් කෙරෙහි අවධානය යොමු කර ඒවා පිළිපැදිය යුතු ය.

11. මෙම ගැසට් නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටලුවක් මතුවුවහොත් ඒ සම්බන්ධයෙන් ද විභාගය මගින් බඳවා ගතයුතු අපේක්ෂක සංඛ්‍යාව සම්බන්ධයෙන් ද තීරණයක් ගැනීමේ බලය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතු වේ. එය අවසන් තීරණය වේ. (පශු සම්පත් සංවර්ධන නිලධාරී සේවාව පිළිබඳ සම්පූර්ණ විස්තර 2005.09.14 දිනැති අංක 1403/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරී සේවාව පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ දක්වා ඇත.)

එච්. එම්. එස්. පී. හේරත්,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

2009 සැප්තැම්බර් මස 10 වැනි දින,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

*පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය*

*සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව*

ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරී සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියේ පශු සම්පත් සංවර්ධන නිලධාරී තනතුර සඳහා අයැදුම්පත

| | |
|---|---|
| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය | |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

අදාළ අංකය කොටුව තුළ ලියන්න :

සිංහල - 2
දෙමළ -3
ඉංග්‍රීසි -4

01. නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————. (උදා. SILVA B. A.)

1.2 සම්පූර්ණ නම සිංහලෙන් :————.

1.3 ජාතික හැඳුනුම්පත් අංකය :

02. ලිපිනය :

2.1 පෞද්ගලික :————.

2.2 රාජකාරි ලිපිනය :————.

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය :————.

03. ස්ත්‍රී /පුරුෂ භාවය : (අදාළ කොටුව තුළ සලකුණු කරන්න.)

3.1 ස්ත්‍රී
පුරුෂ

3.2 උපන් දිනය :

වර්ෂය මාසය දිනය

3.3 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස :

අවුරුදු මාස දින

3.4 විවාහක/අවිවාහක බව (අදාළ ✓ සලකුණු කොටුව තුළ සලකුණු කරන්න.)

විවාහක
අවිවාහක

04. අධ්‍යාපන සුදුසුකම් :-

4.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :

වර්ෂය :————. මාසය :————.

| *විෂය* | *ලබාගත් සාමාර්ථය* | *විභාග අංකය* |
|---|---|---|
| | | |

4.2 (අ) සත්ත්ව පාලන ඩිප්ලෝමාව ලබාගත් ආයතනය :————.

4.3 සත්ව පාලන ඩිප්ලෝමාව ලබාගත් වර්ෂය :————.

05. වර්තමාන රැකියාව හා කලින් දැරූ පත්වීම් : (ඇත්නම් පමණක්)

| *තනතුර* | *ආයතනය* | *සිට* | *දක්වා* |
|---|---|---|---|
| | | | |

06. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලයේ නම :————.

මුදල් ඇනවුම් අංකය :————.

සම්පූර්ණ විභාග ගාස්තුව රු. 300 කි. දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට, ගෙවන කාර්යාලය : පේරාදෙණිය

කුවිතාන්සිය මෙහි අලවන්න.

07. මෙම ඉල්ලුම්පත්‍රයේ ම විසින් සපයන ලද තොරතුරු සත්‍ය වුත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වරැදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවටත්, තෝරා

ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

―――――――.
අයදුම්කරුගේ අත්සන

දිනය :――――――.

දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන්ට පමණක් අදාළ වේ.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

නිලධාරියා විසින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, අපේක්ෂකයා/අපේක්ෂිකාව ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

―――――――.
දෙපාර්තමේන්තු ප්‍රධානියා
(නිල මුද්‍රාව තැබිය යුතුය.)

පදවි නාමය :――――――.

ලිපිනය :――――――.

දිනය :――――――.

10-379

---

## ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සමෘද්ධි කළමනාකරුවන් සඳහා වන II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2009

01. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ V වැනි ශ්‍රේණියේ හා VI වැනි ශ්‍රේණියේ සමෘද්ධි කළමනාකරුවන් සඳහා වන II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී 2009 දෙසැම්බර් මස පවත්වනු ලැබේ. මෙම විභාගය සඳහා I වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් සමෘද්ධි කළමනාකරුවන්ට පෙනී සිටිය හැකි ය.

02. විභාග පරිපාටිය හා විෂය නිර්දේශය :―

මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැය 03 ක ප්‍රශ්න පත්‍රයකට සීමා වේ. මුළු ලකුණු සංඛ්‍යාව 100 ක් වන අතර සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ගණන 40 කි.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය හා ප්‍රාදේශීය සංවර්ධනය ඇතුළත් වර්තමාන සංවර්ධන කටයුතු, ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු හා මුදල් කටයුතු, ප්‍රජා සංවර්ධන කටයුතු වැඩිදියුණු කිරීම, දරිද්‍රතාව පිටු දැකීම, සමෘද්ධි වැඩසටහන් නඟාලීම, මහින්ද චින්තන වැඩපිළිවෙල යටතේ ගම නැගුම වැඩසටහන ඇතුළත්ව අයදුම්කරුවන්ගේ නිර්මාණශීලී හැකියාව හා අවබෝධය මැන බැලීම සඳහා සැකසුණු ප්‍රශ්න පත්‍රයකි.

03. මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් විසින් ස්වකීය අයදුම්පත්‍ර පිළියෙල කරගත යුතු යි. අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුත්තේ A4 ප්‍රමාණයේ කඩදාසියක පමණි. අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ අපේක්ෂකයා විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙන් ය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ 1.0 සිට 6.0 තෙක් පළමුවැනි පිටුවට ද ඉතිරිය 2 වන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරින් ම පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රායෝජනවත් වනු ඇත. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල, ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

04. අයදුම්පත්‍රය තම අංශ ප්‍රධානියා මගින් (දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට අනුයුක්ත වන්නේ නම් එහි දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ මගින්) 2009.11.06 වැනි දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත්‍රය බලා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන විභාගයේ නම සඳහන් කළ යුතු ය. විභාගය සඳහා වූ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු යි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ සහතික කළ ඡායා පිටපත ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

06. අපේක්ෂකයින් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම විභාග ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතුරින් එකක් පමණක් පිළිගැනේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය;
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය (පාස්පෝට් බලපත්‍රය).

07. මෙම විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

08. මෙම විභාගයට පෙනී සිටීමට අයදුම්පත්‍ර එවා ඇති සියලු දෙනාට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලබන අතර, විභාගයට පෙනීසිටීම සඳහා ඔවුන්ට තමන්ගේ කාර්යාලභාර ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දෙනු ඇත. විභාගය ආරම්භ වන දින තම අත්සන් සහතික කරවාගත් ප්‍රවේශපත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

09. මෙම රෙගුලාසිවලට අඩංගු නොවූ යම් කරුණක් වෙතොත්, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතය පරිදි ඒ ගැන ක්‍රියා කරනු ඇත.

ආර්. පී. බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය,
04 වෙනි මහළ, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සමෘද්ධි කළමනාකරුවන් සඳහා වන II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2009

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : (අදාළ අංකය කොටුව තුළ ලියන්න.) [ ] [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

සිංහල - 2
දෙමළ -3

1.0 නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
උදා :SILVA, A. B.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.0 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.1 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.2 රාජකාරි ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ඇත.)

3.0 ස්ත්‍රී/පුරුෂ භාවය :
ස්ත්‍රී -1
පුරුෂ -0 [ ]

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

4.0 විවාහක/අවිවාහක බව :
අවිවාහක - 1
විවාහක - 2 [ ]

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

5.0 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

6.0 උපන් දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

7.0 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස :

අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

8.0 තනතුර හා ශ්‍රේණිය :————.

9.0 පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ වර්ෂය : [ | | | ]

ඉහත දැක්වෙන කරුණු නිවැරදි බවත්, ඉල්ලුම්කර ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————.
අපේක්ෂකයාගේ අත්සන

දිනය :————.

විභාග කොමසාරිස් ජනරාල්,

ඉදිරිපත් කරමි.

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සනාථ කරමි.

————.
අංශ/දිස්ත්‍රික් ප්‍රධානියාගේ අත්සන.
පදවි නාමය හා නිල මුද්‍රාව.

දිනය :————.

10-332